මැතිවරණ දෙපාර්තමේන්තුව
தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය :011-2868441, 2868442, 2868443
பொதுஅலுவலகம்
ෆැක්ස්/தொலைநகல்:011-2868426
*web :www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk*

මැතිවරණ මහලේකම්කාර්යාලය
සරණ මාවත, රාජගිරිය(10107)
தேர்தல்கள் செயலகம்,
சரணமாவத்தை, இராஜகிரிய(10107)

මගේඅංකය :DE/LI/04/2015(PE) ඔබේඅංකය : දිනය :2015.08.08
எனது இல. உமது இல. திகதி

සියලුම තේරීම්භාර නිලධාරීන්

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, රත්නපුරය

නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්

**පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015**
**ශබ්ද විකාශන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව**

පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සම්බන්ධව දේශපාලන පක්ෂ ලේකම්වරු/ බලයලත් නියෝජිතයන් විසින් මා වෙත යොමු කරන ලද ඉල්ලීම් හා බැදේ.

02. 2015 අගෝස්තු මස පසුගිය දිනක අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති එක්සත් ජාතික පක්ෂ ප්‍රචාරක රැලියක් සඳහා ශබ්දවාහිනී බලපත්‍ර ලබාදීමේ දී නිකුත් කර ඇති උපදෙස් සහිත ලිපියක් මා වෙත ලැබී ඇති අතර, ඒ අනුසාරයෙන් සකස් කරන ලද ආදර්ශ ලිපියක් මේ සමඟ එවමි. එහි මෙවැනි රැස්වීම්වල දී ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය පිළිබඳව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සියල්ල ඇතුළත් වී ඇති බැව් මාගේ විශ්වාසයයි.

03. මෙම මැතිවරණයට අදාළ ශබ්ද විකාශන බලපත්‍ර ලබාදීමේ දී දිවයිනේ සියලුම ප්‍රදේශවල පැවැත්වෙන මැතිවරණ ප්‍රචාරක රැස්වීම් වෙනුවෙන් නිකුත් කිරීමට සුදුසු බවට ඔබගේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් වෙත හා පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත කඩිනමින් දන්වා යවනු මැනවි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පිටපත :
01. පොලිස්පති
02. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ)
03. නියෝජ්‍ය පොලිස්පති (මැතිවරණ පැමිණිලි විමර්ශන කාර්යාංශය)

} දැනගැනීම පිණිස හා අවශ්‍ය කටයුතු සඳහා ,

මැතිවරණ කොමසාරිස්
தேர்தல்கள் ஆணையாளர்
දුරකථන/தொலைபேசி :011-2868444
ෆැක්ස්/ தொலைநகல்:011-2868445
*e-mail :comelesl@sltnet.lk*

අතිරේකමැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන)
மேலதிகதேர்தல்கள் ஆணையாளர் (சட்டம் மற்றும் விசாரணை)
දුරකථන/தொலைபேசி:011-2868448
ෆැක්ස්/தொலைநகல் :011-2868448
*e-mail :admin@slelections.gov.lk*

සහකාර පොලිස් අධිකාරී කාර්යාලය,

.............................................

2015.08.

.........................................................

.........................................................

.........................................................

.........................................................

**පාර්ලිමේන්තු මැතිවරණය - 2015**

**ශබ්ද විකාශන බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධව**

2015.08....... දින .................................................................................. අයත් භූමියේ ...................................... පක්ෂයේ ප්‍රචාරක රැස්වීමක් සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍රයක් ලබාදෙන ලෙසට ඉල්ලා ඔබ විසින් ස්ථානාධිපති ......................... මගින් අයදුම්පතක් ඉදිරිපත් කර ඇත.

අ.පො.ස.(උ.පෙළ) විභාගය මෙදින පැය .................... දක්වා පැවැත්වීමට නියමිතව ඇති බැවින් මැතිවරණ ප්‍රචාරක රැස්වීම සඳහා පැය ................ සිට පැය .................. දක්වා ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍රයක් නිකුත් කළ අතර, එය මෙයට අමුණා ඇත.

ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීමේ දී පහත කොන්දේසි අනුගමනය කළ යුතුයි.

01. රැස්වීම පැවැත්වෙන ස්ථානය ආසන්නයේ (අදාළ පරිදි පාසැල/ රෝහල/ ආගමික ස්ථාන) පිහිටා ඇති බැවින් එම ස්ථානයට කිසිදු කරදරයක් හෝ අවහිරයක් සිදුනොකිරීම.

02. ඔබගේ පක්ෂයේ ප්‍රමාණවත් පිරිසක් පොලිසියේ සහය සඳහා යෙදවීම. (රැස්වීමට සහභාගි වන පිරිස හැසිරවීම මින් අපේක්ෂා කරන අතර, ඔවුන් ඇඳ සිටින ඇඳුමෙහි උඩ කොටසෙහි සංවිධායක මණ්ඩලය යනුවෙන් පෙනෙන ලෙස ප්‍රදර්ශනය කර තිබිය යුතු ය.)

03. ..............................මාර්ගයේ රථවාහන ගමනාගමනයට හා පදිකයින්ට බාධාවක් නොවන පරිදි රැස්වීමේ කටයුතු පවත්වාගෙන යාම.

04. ප්‍රතිපක්ෂ දේශපාලන පක්ෂවල අපේක්ෂකයන්, ආධාරකරුවන් හා වාහන ඒ අසලින් ගමන් කිරීමේ දී අවහිර, බාධා සිදුනොකිරීම හා ඔවුන් සමඟ ගැටුමක් ඇති නොවන ලෙස කටයුතු කිරීම.

05. රැස්වීම් භූමිය අසල ඇති පොදු ස්ථානවලට හෝ පෞද්ගලික දේපළවලට කිසිදු ආකාරයක හානියක් හෝ බලපෑමක් නොකිරීම.

06. ඉදිකරනු ලබන වේදිකාවේ සිට මීටර් 15කින් යකඩ වැටක් ඉදිකිරීම. (රැස්වීමට පැමිණෙන විශේෂ ආරක්ෂාව අවශ්‍ය ප්‍රභූවරුන්ගේ ආරක්ෂාව සඳහා)

07. ශබ්ද විකාශන යන්ත්‍ර උත්සව භූමිය දෙසට හරවා තිබිය යුතු අතර, අ.පො.ස.(උ.පෙළ) විභාගය මේ දිනවල පැවැත්වෙන බැවින් එයට බාධාවක් ඇති නොවිය යුතුවා සේම ඒ සඳහා සහ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන සිසු සිසුවියන්ට බාධාවක් නොවිය යුතු ය. ශබ්ද විකාශන යන්ත්‍ර

වලින් පිටවන ශබ්දය රැස්වීම් භූමියේ රැස්වන පිරිසට පමණක් ඇසෙන ආකාරයෙන් හඬ තීව්‍රතාවය පාලනය කල යුතු අතර, ස්ථානාධිපති ........................ විසින් දෙනු ලබන උපදෙස් අනුව හඬ පාලනය කිරිමට ක්‍රියාකළ යුතු ය.

08. ශබ්ද විකාශන යන්ත්‍ර රැස්වීම් භූමිය තුළ පමණක් සවිකළ යුතු අතර, අවට ප්‍රදේශයේ සහ මාර්ගය දිගේ පිහිටා ඇති විදුලි පහන් කණු සහ දුරකතන කණුවල සවිකිරීම කිසිසේත් සිදුනොකළ යුතු ය.

09. සැරසිලි ආදිය රැස්වීම් භූමියට පමණක් සීමා විය යුතු අතර, රැස්වීම අවසන් වූ වහාම වේදිකාව හා සැරසිලි ආදිය ඉවත් කිරීමට කටයුතු කළ යුතු ය.

10. රැස්වීම අවසානයේ සංගීත සංදර්ශන පැවැත්වීම සඳහා මෙම ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍රය වලංගු නොවේ. මෙහි පරමාර්ථය වනුයේ දේශපාලන රැස්වීමක් පැවැත්වීම මිස සංගීත සංදර්ශනයක් පැවැත්වීම නොවන බව සිහිතබා ගත යුතු ය.

11. කිසිදු හේතුවක් මෙම ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍රයේ කාලය පැය 22.00න් පසු දීර්ඝ කිරීමක් සිදුකරනු නොලැබේ.

12. ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය පැය 22.00ට නැවැත්විය යුතු බැවින් පැය 21.00න් පසු කථා පවත්වන දේශපාලනඥයන්ට හෝ කථිකයන්ට හා රැස්වීම් සංවිධායකවරයාට ස්වකීය කථා පැවැත්වීමේ දී කාලය කළමනාකරණය කරගත යුතු බව වරින්වර දැන්විය යුතු ය.

13. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 38/2005 හා පොලිස්පති චක්‍ර ලේඛ අංක 2031/2007 හා 2076/2008 සහ පොලිස් ආඥා පනතේ 79 (3) වගන්තිය මගින් දී ඇති නියෝග හා උපදෙස් සහ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පරිදි මැතිවරණ කොමසාරිස්වරයා විසින් ලබාදෙන උපමානයන්ට අනුකූලව කටයුතු සිදුකළ යුතු බැවින් ඉහත කොන්දේසි උල්ලංඝණය නොවන ආකාරයෙන් කටයුතු සිදුකරනු ඇතැයි හුදෙක්ම බලාපොරොත්තු වෙමි. ඊට පටහැනිව ක්‍රියාකළහොත් එහි වගකීම ඔබ වෙත පැවරෙන බවත්, ඔබ ඇතුළු මැතිවරණ නීතිය උල්ලංඝණය කරන අයවළුන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවත් කාරුණිකව දන්වා සිටිමි.

14. ඉහත සඳහන් කොන්දේසි හිතාමතා කඩකරන බව පෙනී ගියහොත් මෙම ශබ්ද විකාශන බලපත්‍රය ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බව ද දන්වා සිටින අතර, නිදහස් හා සාධාරණ මැතිවරණයක් පවත්වාගෙන යාමටත්, නීතිය ක්‍රියාත්මක කිරීමටත් දක්වන සහයෝගය සම්බන්ධයෙනුත් ස්තුතිවන්ත වෙමි.

සහකාර පොලිස් අධිකාරී

..................................

පිටපත : ස්ථානාධිපති, ................................ - ඉහත කොන්දේසි අනුව කටයුතු කරන්නේදැයි පරීක්ෂා කර අවශ්‍ය පියවර ගැනීම සඳහා

ඉහත කොන්දේසිවලට හා මැතිවරණ නීතියට අනුව කටයුතු කිරීමට එකඟ වෙමි.

..................................................

(අත්සන - ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍ර අයදුම්කරු )

# මැතිවරණ දෙපාර්තමේන්තුව
# தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்

ෆැක්ස්/தொலைநகல் : 011-2868426

*web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk*

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)

தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)


| මගේ අංකය : | ඔබේ අංකය : | දිනය : |
|---|---|---|
| எனது இல. DE/LI/04/2015(PE) | உமது இல. | திகதி 08.08.2015 |

**(මෙම ලිපියේ සිංහල අනුවාදය සඳහා කරුණාකර පසු පිටුව බලන්න)**

**அனைத்துத் தெரிவத்தாட்வி அலுவலர்கள்,**

**சிரேட்ட பிரதித் தேர்தல்கள் ஆணையாளர், இரத்தினபுரி,**

**பிரதி / உதவித் தேர்தல்கள் ஆணையாளர்கள்,**

**<u>பாராளுமன்றப் பொதுத் தேர்தல் - 2015</u>**
**<u>ஒலிபெருக்கி இயந்திரங்களின் பயன்பாட்டிற்கான அனுமதிப் பத்திர விநியோகம் தொடர்பாக.</u>**

பாராளுமன்றத் தேர்தலோடு தொடர்புடையதாக ஒலிபெருக்கி இயந்திரங்களைப் பயன்படுத்துதல் பற்றி அரசியற் கட்சிகளின் செயலாளர்கள், அதிகாரமளிக்கப்பட்ட முகவர்கள் ஆகியோரினால் எனக்கு அனுப்பப்பட்டிருந்த கோரிக்கைகள் தொடர்பாக.

02. 2015 ஆகஸ்ட் மாதத்தின் முந்திய தினமொன்றில் பிரதம மந்திரி திரு. ரணில் விக்கிரமசிங்க அவர்களின் தலைமையில் நடைபெற்ற ஐக்கிய தேசியக் கட்சி பிரச்சாரக் கூட்டமொன்றுக்காக ஒலிபெருக்கி இயந்திரங்களுக்கு அனுமதிப் பத்திரங்கள் வழங்கப்பட்ட பொழுது விநியோகிக்கப்பட்ட அறிவுறுத்தல்களுடன் கூடிய கடிதமொன்று எனக்கு கிடைக்கப்பெற்றுள்ளதோடு, அதன் துணையுடன் தயாரிக்கப்பட்ட மாதிரிக் கடிதமொன்றை இத்துடன் இணைத்தனுப்பி வைக்கின்றேன். இதில் இத்தகைய கூட்டங்களில் ஒலிபெருக்கி இயந்திரங்களின் பாவனை தொடர்பாகப் பின்பற்ற வேண்டிய நடைமுறைகள் அனைத்தும் உள்ளடக்கப்பட்டுள்ளதென நான் எண்ணுகின்றேன்.

03. இத்தேர்தலோடு தொடர்புடைய ஒலிபெருக்கி அனுமதிப் பத்திரங்களை வழங்குகையில் நாட்டின் அனைத்து பிரதேசங்களிலும் நடைபெறுகின்ற தேர்தல் பிரச்சார கூட்டங்களுக்காக விநியோகிக்கப் பொருத்தமானதெனத் தெரிவித்து உங்களது மாவட்டத்தின் சிரேட்ட பொலிஸ் உத்தியோகத்தர்களுக்கும் பொலிஸ் நிலையப் பொறுப்பதிகாரிகளுக்கும் உடனடியாக அறிவிக்க நடவடிக்கையெடுக்கவும்.

**மஹிந்த தேசப்பிரிய,**
தேர்தல்கள் ஆணையாளர்.

பிரதிகள் :-

01. பொலிஸ்மா அதிபர்
02. சிரேட்ட பிரதி பொலிஸ்மா அதிபர் (நிருவாகம் மற்றும் தேர்தல்கள்)
03. பிரதி பொலிஸ்மா அதிபர் (தேர்தல்கள் முறைப்பாட்டு விசாரணைப் பணியகம்)


මැතිවරණ කොමසාරිස්
தேர்தல்கள் ஆணையாளர்

දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන)
மேலதிக தேர்தல்கள் ஆணையாளர் (சட்டம் மற்றும் விசாரணை)

දුරකථන/தொலைபேசி : 011-2868448
ෆැක්ස්/தொலைநகல் : 011-2868448
*e-mail : admin@slelections.gov.lk*